# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2259/35 - 2021 දෙසැම්බර් මස 23 වැනි බ්‍රහස්පතින්දා - 2021.12.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ ඇඹිලිපිටිය නගර සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

නගර සභා ආඥාපනතේ 184 වගන්තියේ ප්‍රකාරව ගරු ආණ්ඩුකාරයා විසින් සභාපතිවරයා ධුරයෙන් ඉවත් කිරීම හේතුකොට ගෙන ඇඹිලිපිටිය නගර සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66 අ(1)(අ) වන වගන්තිය යටතේ ඇඹිලිපිටිය නගර සභාවේ අංක 03 කලගෙඩිආර කොට්ඨාසයට තේරී පත් වූ වවුලන්බොක්ක ගමගේ ලලිත් ධර්ම කීර්ති අයත් වන්නා වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම ඇඹිලිපිටිය නගර සභාවේ අංක 03 කලගෙඩිආර කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා ජාගොඩ ආරච්චිගේ කැලුම්චන්ද්‍ර නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

ඇඹිලිපිටිය නගර සභාවේ තේරීම්භාර නිලධාරි සුරංග අඹගහතැන්නෙ වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් ජාගොඩ ආරච්චිගේ කැළුම්චන්ද්‍ර, ඇඹිලිපිටිය නගර සභාවේ අංක 03 කලගෙඩිආර කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

සුරංග අඹගහතැන්නෙ,
තේරීම්භාර නිලධාරි,
ඇඹිලිපිටිය නගර සභාව.

2021 දෙසැම්බර් මස 22 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
රත්නපුර.

EOG 12 - 0253

1A - G 35641 — 20 (2021/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*